5. 4. 3. 3.

[නිරයසුත්තං]

[සාවත්ථිනිදානං]

23. පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො උපාසකො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි පඤ්චහි:

පාණාතිපාතී හොති –පෙ– සුරාමෙරයමජ්ජපමාදට්ඨායී හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො උපාසකො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ

පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො උපාසකො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි පඤ්චහි:

පාණාතිපාතා පටිවිරතො හොති –පෙ– සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො උපාසකො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

5. 4. 3 4.

[වෙරසුත්තං]

[සාවත්ථිනිදානං]

24. අථ ඛො **අනාථපිණ්ඩිකො ගහපති** යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අනාථපිණ්ඩිකං ගහපතිං භගවා එතදවොච:

පඤ්ච ගහපති, භයානි වෙරානි අප්පහාය දුස්සීලො ඉති වුච්චති. නිරයං ච උපපජ්ජති. කතමානි පඤ්ච:

පාණාතිපාතං, අදින්නාදානං, කාමෙසු මිච්ඡාචාරං, මුසාවාදං, සුරාමෙරයමජ්ජපමාදට්ඨානං.

ඉමානි ඛො ගහපති, පඤ්ච භයානි වෙරානි අප්පහාය දුස්සීලො ඉති වුච්චති. නිරයං ච උපපජ්ජති.

පඤ්ච ගහපති, භයානි වෙරානි පහාය සීලවා ඉති වුච්චති, සුගතිං ච උපපජ්ජති. කතමානි පඤ්ච:

පාණාතිපාතං, අදින්නාදානං, කාමෙසු මිච්ඡාචාරං, මුසාවාදං, සුරාමෙරයමජ්ජපමාදට්ඨානං.

ඉමානි ඛො ගහපති, පඤ්ච භයානි වෙරානි පහාය සීලවා ඉති වුච්චති. සුගතිං ච උපපජ්ජතීති.

5. 4. 3. 3.

[නිරය සූත්‍රය]

[සැවැත්නිදාන යි]

**23**. මහණෙනි, කරුණු පසෙකින් සමන්‍නාගත උවසු ගෙණවුත් බහා තබන ලද්දක් සෙයින් නිරයෙහි උපදනේ වෙයි. කවර පසෙකින යත්:

පණිවා කරන්නේ වෙයි, ... මදපමා දෙකට කරුණු වූ රහමෙර පානය කරන්නේ වෙයි.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්‍නාගත උවසු ගෙණවුත් බහා තබන ලද්දක් යම්සේ නම්, එසේ නිරයෙහි උපදනේ වේ.

මහණෙනි, කරුණු පසෙකින් සමන්‍නාගත උවසු ගෙණවුත් බහා තැබුවක් යම්සේ නම්, එසෙයින් සවගීයෙහි වෙයි. කවර පසෙකින යත්:

පණිවායෙන් වැළැකියේ වෙයි ... මද පමා දෙකට කරුණු වූ රහමෙරින් වැළැකියේ වෙයි.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්‍නාගත උවසු ගෙණවුත් බහා තබන ලද්දක් යම් සේ නම්, එසෙයින් සවගීයෙහි උපදනේ වේ ය යි.

5. 4. 3. 4.

[වෙරසූත්‍රය]

[සැවැත්නිදාන යි]

**24**. එ කල්හි **අනාථපිණ්ඩික ගෘහපති** භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් ව හින. එකත්පස් ව හුන් අනාථපිණ්ඩික ගෘහපතිහට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළෝ:

ගැහැවිය, භය පසක් හා වෛර පසක් හා ප්‍රහීණ නො කිරීමෙන් දුශශීලයෙකැයි කියනු ලැබේ. නිරයට ද පැමිණේ. කවර පසෙක යත්:

පණිවා ය, අයිනාදන් ය, කාමයෙහි මිසහසර ය, මුසවා ය, මද පමා දෙකට කරුණුවූ රහමෙර යැ යි.

ගැහැවිය, මෙ භය පස හා වෛර පස හා ප්‍රහීණ නො කිරීමෙන් දුශශීලයෙකැයි කියනු ලැබේ නිරයට ද පැමිණේ.

ගැහැවිය, භය පසක් හා වෛර පසක් හා ප්‍රහීණ කිරීමෙන් සිල්වත් ය යි කියනු ලැබේ. සුගතියට ද එළඹේ. කවර පසෙක යත්:

පණිවා ය, අයිනාදන් ය, කාමයෙහි මිසහසර ය, මුසවා ය, මද පමා දෙකට කරුණු වූ රහමෙර යි.

ගැහැවිය, මෙ භය පස හා වෛර පස හා ප්‍රහීණ කොට සිල්වත් යයි කියනු ලැබේ. සුගතියට ද එළඹේ ය යි.

යං ගහපති, පාණාතිපාතී පාණාතිපාතපච්චයා දිට්ඨධම්මිකම්පි භයං වෙරං පසවති, සම්පරායිකම්පි භයං වෙරං පසවති, චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. පාණාතිපාතා පටිවිරතො නෙව දිට්ඨධම්මිකං භයං වෙරං පසවති, න සම්පරායිකං භයං වෙරං පසවති, න චෙතසිකං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. පාණාතිපාතා පටිවිරතස්ස එවං තං භයං වෙරං වූපසන්තං හොති. යං ගහපති, අදින්නාදායී -පෙ- යං ගහපති, කාමෙසු මිච්ඡාචාරී -පෙ- යං ගහපති මුසාවාදී -පෙ- යං ගහපති සුරාමෙරයමජ්ජපමාදට්ඨායී සුරාමෙරයමජ්ජපමාදට්ඨානපච්චයා දිට්ඨධම්මිකම්පි භයං වෙරං පසවති, සම්පරායිකම්පි භයං වෙරං පසවති, චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතො නෙව දිට්ඨධම්මිකං භයං වෙරං පසවති, න සම්පරායිකං භයං වෙරං පසවති, න චෙතසිකං දුක්ඛංදොමනස්සං පටිසංවෙදෙති. සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතස්ස එවං තං භයං වෙරං වූපසන්තං හොතීති.

80. යො පාණමතිපාතෙති[1] මුසාවාදඤ්ච භාසති,
ලොකෙ අදින්නං ආදියති පරදාරඤ්ච ගච්ඡති,
සුරාමෙරයපානං ච යො නරො අනුයුඤ්ජති;

81. අප්පහාය පඤ්ච වෙරානි දුස්සීලො ඉති වුච්චති,
කායස්ස භෙදා දුප්පඤ්ඤො නිරයං සොපපජ්ජති

82. යො පාණං නාතිපාතෙති මුසාවාදං න භාසති,
ලොකෙ අදින්නං නාදියති පරදාරං න ගච්ඡති,
සුරාමෙරය පානං ච යො නරො නානුයුඤ්ජති;

83. පහාය පඤ්ච වෙරානි සීලවා ඉති වුච්චති,
කායස්ස භෙදා සප්පඤ්ඤො සුගතිං සොපපජ්ජතීති.

## 5. 4. 3. 5.

## [උපාසකචණ්ඩාලසුත්තං]

[**සාවත්ථිනිදානං**]

**25.** පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො උපාසකො උපාසකචණ්ඩාලො ච හොති උපාසකමලඤ්ච උපාසකපතිකිට්ඨො ච. කතමෙහි පඤ්චහි?

අස්සද්ධො හොති, දුස්සීලො හොති, කොතූහලමඞ්ගලිකො හොති, මඞ්ගලං පච්චෙති නො කම්මං. ඉතො ච බහිද්ධා දක්ඛිණෙය්‍යං ගවෙසති. තත්ථ ච පුබ්බකාරං කරොති.

ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො උපාසකො උපාසකචණ්ඩාලො ච හොති උපාසකමලඤ්ච උපාසකපතිකිට්ඨො ච.[2]

**පඤ්චහි** භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො උපාසකො උපාසකරතනඤ්ච හොති උපාසකපදුමඤ්ච උපාසකපුණ්ඩරීකඤ්ච. කතමෙහි පඤ්චහි:

1 පාණං අතිපාතෙති - සීමු. 2 පතිකුට්ඨො ච - මජ්සං

ගැහැවිය, පණිවා කරණුයේ ප්‍රාණඝාතප්‍රත්‍යයෙන් යම් ම දෘෂ්ටධාර්මික භය හා වෛර හා ප්‍රසව කෙරේ නම්, සාම්පරායික භය හා වෛර හා ප්‍රසව කෙරේ නම්, මානසික දුක්දෙම්නස් විඳුනේ නම්, පණිවායෙන් දුරුවූයේ දෘෂ්ටධාර්මික භය හා වෛර හා නො ම ප්‍රසව කෙරෙයි, සාම්පරායික භය හා වෛර හා නො ම ප්‍රසව කෙරෙයි, මානසික දුක්දෙම්නස් නො ම විඳුනේ ය. පණිවායෙන් දුරුවූවහුට මෙසේ එ භය හා වෛර හා සන්හුන් වෙයි. ගැහැවිය, අයිනාදන් ගන්නා සුලුයේ ... ගැහැවිය, කාමයෙහි මිසහසර ඇතියේ ... ගැහැවිය, මුසාබස් කියනුයේ ... ගැහැවිය, මද පමා දෙකට කරුණු වූ රහමෙර බොනුයේ මදපමා දෙකට කරුණු වූ රහමෙර බිඳි හෙතුයෙන් යම් දෘෂ්ටධාර්මික භය හා වෛර හා ප්‍රසව කෙරේ නම්, සාම්පරායික භය හා වෛර හා ප්‍රසව කෙරේ නම්, මානසික දුක්දෙම්නස් විඳුනේ නම්, මද පමා දෙකට කරුණු වූ රහමෙරින් දුරු වූයේ එ දෘෂ්ටධාර්මික භය හා වෛර හා ප්‍රසව නො කෙරෙයි. සාම්පරායික භය හා වෛර හා ප්‍රසව නො කෙරෙයි. මානසික දුක්දෙම්නස් නො ම විඳුනේ ය. මද පමා දෙකට කරුණු වූ රහමෙරින් දුරු වූවහුට මෙ ලෙසින් එ භය හා වෛර හා සන්හිඳුනේ වේ යයි.

**80.** යමෙක් පණිවා කෙරේ නම්, මුසවාත් බෙණේ නම්, ලොව්හි නුදුන් ද ගන්නේ නම්, පරඹුන් කරා ද යේ නම්, යම් පුහුලෙක් රහමෙර පානයත් කෙරේ නම්,

**81.** හේ පඤ්ච වෛරයන් ප්‍රහීණ නො කොට දුශශීලයෙකැයි කියනු ලැබේ. ඒ දුෂ්ප්‍රාඥ කාබුන් මරණින් මතු නිරයට එළඹෙයි.

**82.** යමෙක් පණිවා නො කෙරේ ද, මුසවා නො බෙණේ ද, ලොව්හි අයිනාදන් නොගන්නේ ද, පරඹුන් කරා නො යේ ද, යම් නරයෙක් රහමෙර පානයෙහිත් නො යෙදේ ද,

**83.** හේ පඤ්ච වෛරයන් දුරු කොට සිල්වත් ය යි කියනු ලැබේ. කාබුන් මරණින් මතු ඒ සප්‍රාඥ තෙමේ සුගතියට පැමිණේ ය යි.

5. 4. 3. 5.

## [උපාසකචණ්ඩාල සූත්‍රය]

[සැවැත්නිදන යි]

**25.** මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත උපාසක, උපාසකචණ්ඩාල ද උපාසකමල ද උපාසකප්‍රතිකෘෂ්ට (උපාසක පිළිකුල) ද වෙයි. කවර පසෙකින යත්:

ශ්‍රද්ධා නැත්තේ වෙයි. දුශශීල වෙයි. කොතුහලමඞ්ගලික (සුබනිමිති-බලනු) යෙක් වෙයි. කර්මය නො ව මඞ්ගලය අදහයි. මෙ සස්නෙන් බැහැර දක්ෂිණාර්හයකු සොයයි. එහිදු පූර්වකාර කෙරෙයි.

මහණෙනි, මෙ කරුණු පසින් සමන්‍වාගත උපාසක, උපාසකචණ්ඩාල හා උපාසකමල හා උපාසක ප්‍රතිකෘෂ්ට හා වෙයි.

මහණෙනි, කරුණු පසෙකින් සමන්‍වාගත උපාසක, උපාසකරත්න හා උපාසකපද්ම හා උපාසකපුණ්ඩරීක හා වෙයි. කවර පසෙකින යත්: